# ආර්ථික විද්‍යාව
# අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය
# 06. සාර්ව ආර්ථික සමතුලිතය තීරණය වන ආකාරය
## බහුවරණ ප්‍රශ්න

අංක 01 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු අතරින් **නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර** තෝරන්න.

1) සාර්ව ආර්ථික සමතුලිතය යනු,
   (1) ආර්ථිකයේ සමස්ත ඉල්ලුමේ වටිනාකම සමස්ත වියදමට සමාන වීමයි.
   (2) ආර්ථිකයේ සමස්ත නිමවුමේ වටිනාකමට සමාන සමස්ත ඉල්ලුමක් පැවතීමයි.
   (3) ආර්ථිකයේ සමස්ත නිමවුමත් පූර්ණ සේවා නියුක්තියත් සමාන මට්ටමක පැවතීමයි.
   (4) ආර්ථිකයේ සමස්ත ඉල්ලුමට ආර්ථිකයේ සමස්ත විදීම් සමාන වීම.
   (5) ආර්ථිකයේ සමස්ත නිෂ්පාදනය සමස්ත සේවා නියුක්තියට සමාන වීම.

2) පහත තොරතුරු වලට අනුව සාර්ව ආර්ථික සමතුලිතය පවතිනුයේ කුමන පිළිතුර තුළද?


| | I | G | X | S | T | M |
|---|---|---|---|---|---|---|
| (1) | 80 | 100 | 50 | 25 | 10 | 20 |
| (2) | 20 | 40 | 80 | 50 | 20 | 10 |
| (3) | 10 | 30 | 50 | 40 | 20 | 30 |
| (4) | 40 | 20 | 80 | 40 | 10 | 50 |
| (5) | 50 | 30 | 10 | 50 | 20 | 50 |

3) ආර්ථිකයක ප්‍රධාන වියදම් සංරචක වනුයේ,
   (1) පරිභෝජන වියදම, රාජ්‍ය මිලදී ගැනීම් , අපනයන හා දළ ආයෝජනය
   (2) දළ ආයෝජනය, රාජ්‍ය මිලදී ගැනීම් හා පෞද්ගලික පරිභෝජනය
   (3) ස්වාධීන පරිභෝජනය, රාජ්‍ය මිලදී ගැනීම්, අපනයන හා දළ ආයෝජනය
   (4) පෞද්ගලික පරිභෝජනය, රාජ්‍ය මිලදී ගැනීම්, දළ ආයෝජනය , අපනයන හා ආනයන අතර වෙනස
   (5) පෞද්ගලික පරිභෝජනය, දළ ආයෝජනය, අපනයන හා ආනයන අතර වෙනස

4) එක්තරා ආර්ථිකයක වැයකළ හැකි ආදායම 1000 සිට 1500 දක්වා ඉහළ යාමේදී පරිභෝජනය 1000 සිට 1400 දක්වා ඉහළ ගියේ නම්, එම ආර්ථිකයේ පරිභෝජන ශ්‍රිතය කුමක්ද?
   (1) C=300+0.8yd
   (2) C=200+0.5yd
   (3) C=400+0.8yd
   (4) C=200+0.7yd
   (5) C=200+0.8yd

5) පරිභෝජන රේඛාවේ බෑවුමෙන් පෙන්නුම් කෙරෙනුයේ,
   (1) ආන්තික ඉතුරුම් නැම්යාවයි.
   (2) ආන්තික පරිභෝජන නැම්යාවයි.
   (3) සාමාන්‍ය පරිභෝජන නැම්යාවයි.
   (4) සාමාන්‍ය ඉතුරුම් නැම්යාවයි.
   (5) ඉහත කිසිවක් නොවේ.

6) පහත දැක්වෙන පරිභෝජන ශ්‍රිතය C සිට $C_1$ දක්වා විතැන්වීම තුලින් පැහැදිලි වනුයේ,




(1) ආන්තික පරිභෝජන නැම්යාවේ ඉහළ යාමක්
(2) ආන්තික පරිභෝජන නැම්යාවේ පහළ යාමක්
(3) ස්වාධීන පරිභෝජනයේ පහළ යාමක්
(4) ස්වාධීන පරිභෝජනයේ ඉහළ යාමක්
(5) සෘණ ඉතුරුම්වල පහළ යාමක්

7) ආදායම පරිභෝජන වියදමට වඩා ඉහළ මට්ටමක පවතින විට ,
   (1) ඉතුරුම් අපශේෂය සෘණ වේ
   (2) පෙළඹුණු පරිභෝජනය සෘණ වේ
   (3) ඉතුරුම් ශුන්‍ය වේ
   (4) ඉතුරුම් ධන වේ
   (5) ස්වාධීන පරිභෝජනය ශුන්‍ය වේ

8) පහත තොරතුරු ඇසුරින් ස්වාධීන වියදම්වල එකතුව ඇතුළත් නිවැරදි පිළිතුර වන්නේ,
   C = 300+0.7yd
   I = 200
   G = 400

(1) 400
(2) 500
(3) 600
(4) 700
(5) 900

9) ආයෝජන වියදම පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය වනුයේ,
   (1) ආයෝජන වියදම සමාහාර වියදමේ සංරචකයකි.
   (2) ආයෝජන වියදම ස්වාධීන වියදමකි.
   (3) ආයෝජන වක්‍රයේ බෑවුම ශූන්‍ය අගයක් ගනී.
   (4) ආයෝජන වක්‍රය තිරස් අගයට සමාන්තරව පිහිටයි.
   (5) ආයෝජනය පරායත්ත විචල්‍යකි.

10) ආර්ථිකයක පෙළඹුණු පරිභෝජනය 800ක් වන අතර ස්වාධීන පරිභෝජනය 200කි. ආදායමෙන් වියදම් කරන 80%ක් වේ නම්, වැය කළ හැකි ආදායම හා පරිභෝජන ශ්‍රිතය ඇතුළත් නිවැරදි පිළිතුර වනුයේ මින් කුමක්ද?

| | පරිභෝජන ශ්‍රිතය | වැය කළ හැකි ආදායම |
|---|---|---|
| (1) | C = 100 + 0.6 yd | 1 000 |
| (2) | C = 200 + 0.7 yd | 3 000 |
| (3) | C = 300 + 0.8 yd | 640 |
| (4) | C = 200 + 0.8 yd | 1 000 |
| (5) | C = 300 + 0.7 yd | 2 000 |

11) කල්පිත ආර්ථිකයකට අදාල තොරතුරු පහත දැක්වේ.

S = - 100 + 0.2yd
I = 200
G = 300
T = 50 වන්නේ නම් සාර්ව ආර්ථික සමතුලිතයේ අගය ඇතුලත් පිළිතුර තෝරන්න.

(1) 1 800
(2) 2 500
(3) 2 800
(4) 3 800
(5) 4 300

12) කිසියම් ආර්ථිකයක සාර්ව ආර්ථික තොරතුරු පහත දැක්වේ.
S = 400 T = 200 G = 200 M = 500 I = 100 NX = 300

ඒ අනුව සාර්ව ආර්ථික සමතුලිතය වන්නේ,
(1) 900
(2) 1 000
(3) 1 100
(4) 1 200
(5) 1 350

ආර්ථික හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

13) ආර්ථිකයක කාන්දු වීම් ඉහළ යන විට සමස්ථ නිෂ්පාදනය

(1) ඉහළ යයි
(2) පහළ යයි
(3) ස්ථාවර අගයේ පවතී
(4) පරිභෝජන වියදම් ඉහළ යයි
(5) ආයෝජන ඉහළ යයි


14) ආර්ථිකයක සාර්ව ආර්ථික සමතුලිතය රු.මිලි. 2 000ක් වන අතර ස්වාධීන පරිභෝජනය 200කි. ආයෝජනය 100ක් වන අතර ආන්තික පරිභෝජන නැමියාව 0.75කි. රාජ්‍ය මිලදී ගැනීම්වල අගය වනුයේ,

(1) 100
(2) 200
(3) 400
(4) 600
(5) 800

15) ආර්ථිකයක ආදායම වියදමට වඩා පහළ අගයක් ගන්නේ නම් ආර්ථිකයේ නිෂ්පාදන මට්ටම,

(1) ස්ථාවර වේ
(2) ඉහළ යයි
(3) පහළ යයි
(4) ඉතුරුම් ධන වේ
(5) ඉතුරුම් ශූන්‍ය වේ

16) ආර්ථිකයේ ආයෝජන වියදම් පහත ආකාරයට වෙනස් වුවහොත් සිදුවිය හැකි ප්‍රතිඵලයක් නොවන්නේ, පහත පිළිතුරු අතරින් කුමක්ද?




(1) සමතුලිත ආදායම ඉහළ යාම
(2) ආයෝජන අනුපාතයේ ඉහළ යාම
(3) දේශීය ඉතුරුම් වැඩි වීම
(4) ආන්තික පරිභෝජන නැමියාව ස්ථාවර වීම
(5) ආයෝජන අනුපාතය පහළ යාම

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

17) ආර්ථිකයක සමාහාර වියදමෙහි වෙනස 200ක් වන අතර සමාහාර ආදායමෙහි වෙනස 800කි. මෙම ආර්ථිකයේ ස්වාධීන වියදම් ගුණකය හා ආන්තික පරිභෝජන නැමියාව කොපමණද?

| | ස්වාධීන වියදම් ගුණකය | ආන්තික පරිභෝජන නැමියාව |
|---|---|---|
| (1) | 5 | 0.8 |
| (2) | 4 | 0.8 |
| (3) | 5 | 0.75 |
| (4) | 4 | 0.75 |
| (5) | 4 | 0.25 |

18) ආර්ථිකයක ස්වාධීන වියදම් ගුණකය 5ක් වන අතර එම ආර්ථිකයට පූර්ණ සේවා නියුක්තියට ළඟා වීම රු.මිලි. 2 000ක ඉහළ යාමක් අවශ්‍ය වේ නම්, රාජ්‍ය වියදම හෝ ආයෝජනය කොපමණ ප්‍රමාණයකින් ඉහළ දැමිය යුතු වේද?

(1) 100
(2) 300
(3) 400
(4) 500
(5) 600

19) ආර්ථිකයක රාජ්‍ය මිලදී ගැනීම් හා බදු අය කිරීම් එක හා සමාන අගයකින් ඉහළ දැමීම සිදු කළහොත් ආර්ථිකයේ සමතුලිතයට සහ අයවැයට සිදු වන බලපෑම මින් කුමක්ද?

| | සමතුලිතය | අයවැය |
|---|---|---|
| (1) | පහළ යයි | තුලිත වේ |
| (2) | ඉහළ යයි | ඉහළ යයි |
| (3) | ඉහළ යයි | තුලිත වේ |
| (4) | පහළ යයි | පහළ යයි |
| (5) | ස්ථාවර වේ | තුලිතවේ |

20) ආර්ථිකයක පරිභෝජන වියදම ඉහළ ගියහොත් සාර්ව ආර්ථික සමතුලිතයට සිදුවන බලපෑම නිවැරදිව දැක්වෙනුයේ,
(1) කාන්දු වීම් ඉහළ ගොස් සමතුලිතය වැඩි වීම.
(2) කාන්දුවීම් අඩුවී සමතුලිතය පහළ යාම.
(3) සමාහාර වියදම් අඩු වී සමතුලිතය පහළ යාම.
(4) සමාහාර වියදම් වැඩිවී සමතුලිතය ස්ථාවර වීම.
(5) කාන්දු වීම් අඩුවී සමතුලිතය ඉහළ යාම.